**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**
**ශාස්ත්‍ර පීඨය**
**ශාස්ත්‍රවේදී ප්‍රථම වසර පරීක්ෂණය**
**පළමු සෙමෙස්තර අවසාන පරීක්ෂණය – 2023/2024**

# GYG 1106 - භූගෝලවිද්‍යාවේ මූලධර්ම

**කාලය:** පැ දෙකයි (02)

ප්‍රශ්න පත්‍රය **කොටස් දෙකකින්** සහ **ප්‍රශ්න හතකින් (07)** සමන්විත ය.
පළමුවන කොටසින් **එක්** ප්‍රශ්නයක් සහ දෙවන කොටසින් ප්‍රශ්න **තුනක්** බැගින් තෝරාගෙන **ප්‍රශ්න හතරකට (04)** පිළිතුරු සපයන්න.
ලෝක ආකෘති සිතියම් දෙකක් (02) සපයනු ලැබේ.

---

## I කොටස

1.

i) ‘ඇල්බිඩෝව (Albedo)’ අර්ථ දක්වන්න.

(ලකුණු 05)

ii) අනෙකුත් අක්ෂාංශිය කලාපවලට සාපේක්ෂව නිවර්තනික කලාපයට වැඩි සූර්යතපන ප්‍රමාණයක් ලැබෙන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

2.

i) පරිසර පද්ධතියක ප්‍රධාන සංරචක උදාහරණ සහිතව දක්වන්න. (ලකුණු 05)

ii) සුදුසු රූප සටහන් භාවිත කර ගනිමින් පරිසර පද්ධතියක ශක්ති ගැලීම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

## II කොටස

3.

i) ‘මානව සම්පත්’ යන්න නිර්වචනය කරන්න. (ලකුණු 05)

ii) රටක මානව සම්පත් වැඩි දියුණු කිරීම සඳහා මෘදු කුසලතා හා දෘඪ කුසලතාවල (Soft skills and Hard skills) බලපෑම සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

4.

i) මානවයාගේ සමෙහි වර්ණය තීරණය කිරීමේදී පාරිසරික සාධකවල බලපෑම කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

ii) "දකුණු අප්‍රිකාවේ වර්ණභේදවාදය (apartheidism) අවසන් වී වසර තිහක් ගත වී ඇති නමුත් එය අදටත් අහිතකර බලපෑම් ගෙන එයි." මෙම ප්‍රකාශය සුදුසු උදාහරණ සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

5.

i) 'ප්‍රාථමික ආර්ථික කටයුතු' යන යෙදුම කෙටියෙන් පැහැදිලි කරන්න .

(ලකුණු 05)

ii) සුදුසු උදාහරණ දක්වමින් ප්‍රාථමික හා ද්විතියික ආර්ථික කටයුතු අතර සම්බන්ධතාව විග්‍රහ කරන්න.

(ලකුණු 10)

6.

i) වර්තමාන ලෝකයේ සාඵල්‍යතා රටා කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

ii) සුදුසු උදාහරණ දක්වමින් ඉහත 6 (i) හි ඔබ සඳහන් කළ සාඵල්‍යතා රටාවන් තීරණය කරන සමාජ-ආර්ථික සාධක පැහැදිලි කරන්න.

(ලකුණු 10)

7.

i) 'සංවර්ධනය' යන යෙදුම කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

ii) ලෝකයේ විවිධ රටවල පවතින සංවර්ධන විෂමතාවලට හේතු විමසන්න.

(ලකුණු 10)

*******************